# හදවතක රිද්මය



තීක්ෂණා දින්ලිනී
වෙලේගෙදර

# හදවතක රිද්මය

කතෘ:- තීක්ෂණා දින්ලිනී වෙලේගෙදර

කතෘගේ වෙනත් කෘති

¥ නොනිවුණු ගිනිදැල්

¥ (අ)ප්‍රකාශිත

¥ ධීර්

මහ/මහමායා බාලිකා විද්‍යාලය

මහනුවර

9C

2026/05/10

9786242089591

පිදුම

ජීවිතේ දිනන්නට මං කියාදෙමින්,හරි අපූරුවට මා යහමගට යොමු කර,මගේ සැගවුණු හැකියාවන් හදුනා ගැනීමට තෝතැන්නක් වූ මගේ සදාදර මහමායා විදුහල් මැණියන්ට සෙනෙහසින්......

# පෙරවදන

දිනෙන් දින සංකීර්ණ වන ගෝලීය අනාගත ලෝකයට දියණියන් සූදානම් කරණ බාලිකා අධ්‍යාපනයෙ හැරවුම් ලක්ෂයක් ලෙස මහමායා බාලිකා විද්‍යාලයෙ මූලිකත්වයෙන් සිදු කරන හේමමාලා උපහාර ගත්කරණ ව ව්‍යාපෘතිය නම් කල හැක. දශකයක තරම් කාලයක් දහස් ගණනක් දැයේ දරුවන් ගත් කතුවරුන් ලෙස දැයට දායාද කරන්නට හැකිවීම පාසලක් වශයෙන් ලබන විශිෂ්ට ජයග්‍රහණයකි. මෙවර වෙනත් පාසල් හා එක්ව පාසල් දරුවන්ට නව අත්දැකීම් සමුදායක් සන්නිවේදන නිපුණතා සාරධර්ම මෙන්ම නිර්ණාත්මක ප්‍රවර්ධනය වැනි බහුවිධ කුසලතා සංවර්ධනය අරමුණු කොටගෙන පොත් ලියන්නට යොමු කරන ලදී. එහි ප්‍රතිඵලයක් ලෙස ලියැවි ඇති ළමා ග්‍රන්ථ තුළින් ලෝක බෞද්ධ ජනතාවගේ පූජනීය සංකේතය කන්ද උඩරට අංගයක් එකතු කළ ශ්‍රී දළදා වහන්සේ වැඩම කර වූ හේමමාලා කුමරියට උපහාරයක් වීම මෙවර අපගේ මූලික අරමුණයි. මේ සඳහා නිර්මාණකරණයෙන් දායක වූ පාසල් දරුවන් මග පෙන්වූ ගුරුබවතුන් ඇතුළු සැමට ස්තුතිය පුද කරමි.

ශෂිකලා සේනාධිර

විදුහල්පතිතුමිය

මහමායාබාලිකා විද්‍යාලය

මහනුවර

සුභාශිංසන පණිවුඩය

මහනුවර මහමායා බාලිකා විද්‍යාලය ආරම්භ කර ඇති හේමමාලා උපහාර ග්‍රන්ථ කරන ව්‍යාපෘතිය තුළින් නිර්මාණය වූ ග්‍රන්ථ එළිදැක්වීම වෙනුවෙන් මධ්‍යම පළාත් ආණ්ඩුකාර වර වශයෙන් සුභාශිංසන පණිවිඩයක් එක් කිරීමට ලැබීම මා ලැබූ භාග්‍යක් කොට සළකමි.

අධ්‍යාපනය යනු සමාජයේ ප්‍රගතියට මූලික පදනම වන අතර,එය පොත් පත් හා සාහිත්‍ය නිර්මාණ හරහා තවදුරටත් ශක්තිමත් වේ.සිසු දරුවන්ගේ දක්ෂතා,නිර්මාණශීලිත්වය සහ බුද්ධිමය හැකියාවන් මෙවැනි ව්‍යාපෘති මගින් මතුවීම ඉතා ප්‍රශංසනීය බව පැහැදිලිය.

මෙම ග්‍රන්ථ කරන ව්‍යාපෘතිය තුළින් සිසු දරුවන්ට පමණක් නොව,සමස්ත සමාජයටම වටිනා දැනුමක් සහ අගනා සාහිත්‍ය දායාදයක් ලබා දෙනු ඇති බව විශ්වාස කරමි.එමෙන්ම මෙවැනි උත්සහයන් තුළින් අනාගතයේ ශ්‍රී ලංකාවට අභිමානයක් වන ලේඛිකාවන් බිහිවනු ඇතැයි බලාපොරොත්තු වෙමි.

මෙම සාර්ථක කටයුත්ත සඳහා කැපවූ විදුහල්පතිතුමිය, ගුරුමංණ්ඩලය, සිසුදරුවන් සහ සම්බන්ද වූ සියලු දෙනාට මාගේ හර්ද්‍යාංගම ප්‍රශංසාව සහ ආශිර්වාදය පිරිනමමි. මෙම වියපෘතිය සහ ග්‍රන්ථ එළි දැක්වීමෙ උත්සවය විශිෂ්ට සාර්ථකත්වයක් ලබනු ඇතැයි ප්‍රාර්ථනා කරමි.

සරත් බී.එස්. අඹිහයකෝන්,

ආණ්ඩුකාරවර,මධ්‍යම පළාත,

සම්මානනීය මහාචාර්‍යය,පේරාදෙනිය විශ්වවිද්‍යාලය,

2026.05.10

සුභාශිංසන පණිවුඩය

වත්මන් පාසල් පද්ධතිය තුළ දූ දරුවන් ග්‍රන්ථ කරණයට යොමු කිරීමේ අරමුණින් මහනුවර මහමායා බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් මහනුවර කලාපයේ සෙසු පාසල් වල සහභාගිත්වයෙන් මෙවර පරම පූජනීය ශ්‍රී දළදා වහන්සේ ලක්දිවට වැඩම කළ හේමමාලා කුමරියට උපහාර පිණිස ග්‍රන්ථ එළි දැක්වීමේ ව්‍යාපෘතියක් සංවිධානය කළ මහනුවර මහමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පතිතුමිය ඇතුළු ආචාර්ය මංඩලය,ශිෂ්‍යා දියණිවරුන්ට,සෙසු පාසල් වල දූ පුතුන්ට සහ මෙම ව්‍යාපෘතිය සැලසුම් කර ක්‍රියාවට නැංවීමට කැපවූ සියලු දෙනාගේ විශිෂ්ට වූ උතුම් ප්‍රයත්නය අතිශයින් අගය කරමි.

ශ්‍රී ලංකාව දශක කිහිපයක් තිස්සේ සියලු දරුවන්ට නිදහස්,අනිවාර්ය,ගුණාත්මක හා සාධාරණ අධ්‍යාපනයක් ලබා දීමටත් එමගින් අනාගතේදී බුද්ධිමත් කුසලතා පූර්ණ සුරපාපි පරපුරක් බිහිකිරීමටත් කැපවී සිටී.එවන් පසුබිමක සුසමාහිතවූ සමබර පෞරුෂයක් සඳහා නිර්මාණ හැකියාව,විචාරශීලී චින්තනය ඇතුළු ධනාත්මක අංග ලක්ෂණ සංවර්ධනය වී අනාගත දැනුම් පාදක සමාජයක් නිර්මාණය කිරීමට පාසල් දරුවන්ගේ මෙම ග්‍රන්ථ කරණ වැඩසටහන හේතුපාදක වේ. ශ්‍රී දළදා සමිඳු සරණින් හේම මාලා උපහාර ග්‍රන්ථ කරණ ව්‍යාපෘතියේ සියලු කටයුතු සාර්ථක වේවායි මම ප්‍රාර්ථනා කරමි.

ප්‍රදීප් නිලංග දැල,

දියවඩන නිලමේ,

ශ්‍රී දළදා මාළිගාව,

2026.05.10.

~~~~~~~~~~~~~ මියැදුනු හැඟීමක මතක ආවර්ජනය~~~~~~~~~~~
~~~~~~~~~~~~~

## මහවැස්ස

අහස කළු කර වැටෙන වැහිබිඳු
වලින් නැහැවී යයි ගතත්
ඇසෙන් වැටෙනා කඳුළු බින්දුත්
පෙනෙන්නෑ දැන් කාටවත්

හිතේ ඇවිලෙන මහා ගින්දර
නිවී යයි දැන් ඉක්මනින්
අඩන්නට නම් පිරිමියෙක් හට
මහා වැස්සක් වැටිය යුතුමයි.

# <u>තරුව</u>

සඳ වටේටම මහ ගොඩක් තරු
බලන් හිටියත් රාත්‍රියේ
සඳ රැයේදීම සෙව්වෙ එකමෙක
සොඳුරු තරුවකි අන්තිමේ

බලා ඉඳහිට සොයා බැලුවත්
තරුව ගැන නෙක නෙක තතු
තරුව තවමත් බලන් ඉන්නෙ
වෙනත් තරුවක් එනතුරු

## <u>අදුරු කුටිය</u>

අදුරු කුටියක වැසුනු දොරගුලු
බිදින්නට බෑ කාටවත්
අදුරු කුටියක් වෙන්න පෙරදිම
සොදුරු කුටියක් විය එයත්

සොදුරු කුටියක් අදුරු කුටියක්
බවට හැරවූ කාරණාවක්
මැකිය නොහැකිව හදක සිරවූ
සොදුරු එකමෙක හැගීමක්

<u>සූරියකාන්ත</u>

ඉර නැගෙනවිට මල පිපෙනවා

ඉර හැරෙන විට එයත් හැරෙනවා

අවසානයේ,

ඉර මත්තෙම නැසීයනවා.

<u>සුදු අරලිය</u>

රතු රෝස සුදු රෝස

අතින් අතකට ගියාට

සුදු අරලිය හැමදාම

ලැගුම් ගත්තේම

සොහොන් කොත් ළග

# අමාවකත් හරි ලස්සනයි.

සියළු මිනිසුන් පවසනා ලෙස
පුරහඳත් හරි ලස්සනයි
සඳ නැති දිනට අහස තනිකර
පාළු සොහොනක් වගෙයි
නොකීවත්,
තරුම විතරක් රටා මවනා
අමාවකත් හරි ලස්සනයි

## අයියා

නින්ද හොයනා
නෙත් දෙකක් ළග
අදුර රජකරවයි රැයේ
හිතේ පාළුව මකාගන්නට
ඔහුත් ළගනෑ රාත්‍රියේ
හැර නොයනබව
කීවමුත් ඔහු එම දිනේ
මාත් තනිකර ඔහුත් ගොස් ඇත
මමත් තනියම රාත්‍රියේ.

දෙවෙනි පියෙකු ලෙස දුන්න ආලය
කිසිදු අඩුවක් මට නැතේ
තවත් එකමෙක වතාවකටත්
ඇවිත් යනවද මගේ අයියේ

## <u>මිතුදම</u>

රණ්ඩුවක් ලෙස ඇරඹී මිතුදම

තාම නොමැකෙන ලෙස තියේ

බිඳුනු සිතිවිලි වලට පණ දී

නැවත මිතුදම ඇරඹුණේ

එතැන් සිට අද වනතුරාවට

අදින් පසුවත් හෙට දිනය තෙක්

මිතුර ඔබමයි මගෙ හදේ

<u>ආගම</u>

වැයෙන ගැටබෙර හඬට අවනත
වෙමින් නටනා හරි අපූරුව
සිලම්බුවෙන් නැගෙන හඬනම්
දෙවෙනි වෙන්නෑ මොකටවත්
හැඩට කැඩෙනා හීනි ඉග සුග
වලින් පෙනුනේ ලස්සනයි
තකට ජිං තක හඬට තබනා
පාද වලටත් මහන්සියි
ඉතින්,
එයත් එක් ලෙසක
ආගමක් විය
බැතිමතුන් සිය
ගණන් අදහන

මනමේ

## තිස් වසරක යුද්ධය

තිස් වසරක් පුරා පැවති යුද්ධය
එක්තරා නිමේෂයක නිමා වුවත්
යුද්ධය නිසා නැතිවුණු ජීවිත
ගැනිය නොහැකි තරම්ය
එකල වැසි වෙනුවට
රුධිරය පමණක්ම
මහපොළොවට වැටුණ
වාර අනන්තය

දරුවන් නිවෙස් කරා
එනතෙක් බලා සිටි දෙමව්පියන්ගෙ,
පියවරුන් එතැයි බලාසිටි
දරුවන්ගෙ ගෙවල් වලට
සීල් කරපු මිනී පෙට්ටියක්
ආපු අවස්ථාද නැතුවාම නොවෙයි

යුද්ධය යනු
දේශපාලකයන්ට හුදෙක්
එක් මාතෘකාවක්ම පමණක්
වුවත් එකල යුද්ධයෙන්
බැටකෑ මිනිසුන්ට මෙන්ම
එකල ජීවිත නැතිවූවන්ගේ

පවුල් වල සාමාජිකයන්ට
එය එක්තරා අඳුරු
මතකයක්ම විය
එකල ජීවත් වූවන්
කෙතරම් බයකින්
ජීවත් වන්න්ට ඇත්ද?

උතුරෙ මන්ම නැගෙනහිර
යුධ ගිනිදැල් ඇවිලෙද්දි
බරහිර මෙන්ම දකුණෙත්
නිහඬ යුද්ධයක් ඇවිලිණි

එසේනම්
යුද්ධය යනු හුදෙක්
එක් මාතෘකාවක්ම නොව
එකල යුද්ධයෙන්
බැට කෑ මිනිසුන්ගේ මෙන්ම
ජීවිත පරිත්‍යාග කල සොල්දාදුවන්ගේ
(අ)ප්‍රකාශිත හැඟීම් සමුදායක
මතක ආවර්ජනයකි.

<u>ජීවය</u>

අගය නොදැනෙන
යමක් ඇත්නම්
එයත් කෙනෙකුගෙ
ජීවයයි
හැරගිය දිනෙක
ලොවේ වටිනම
යමක් ඇත්නම්
ජීවයයි

ඇති විටදි කිසි
අගයක් නැති
නැති විටකදි
අගය දැනෙන
එක් දෙයක්නම් ජීවයයි.

## ගිණියම් උණ්ඩය

ජීවිතේ එක් තැනක ගත්තා
වෙහෙස කර තීරණයක්
උණ්ඩක් අත දරාගත්තේ
ජීවයක් රකිනා වෙසින්

සිය ගණන් ජීවිතත් රැකුණා
සියලු දේවල් නිමා වූවා
මතක පමණක් ඉතිරි වූවා
අඳුරු මතකය ඉතිරි කරමින්

තල් ගස් අරණක සිට
සැඟවෙමින් යුද්ධ කළ
කලක් තිබුණා අතීතයේ
අපේ විරුවන් විසින්

ආචාර වෙඩිමුර පෙලක්
ඇසුණා අවසානයේ
සිය දහස් ගාණක්
මිණී පෙට්ටිවල
නිදනවා මේ යාමයේ

දෙන්න අපහට

නිදහස් ලොවක්

ඔවුන් දුන්නා ජීවිතත්

ඉතිහාසයෙ

රන් අකුරෙන් ලියවෙමින්

ඔවුන් එතෙර වූවා

විරුවන්ගේ නිම්නයට

## කුවේණී

නැද්ද දරු සෙනෙහසක් ඇගේ
ඇයත් අම්මෙක් විය අනේ
දරුදෙදෙනව ඇතැරියත්
එයත් වුණේ හොදක් සදේ

ශාප කරත් විජය රජුට
ඇයට උණෙ සාධාරණයද
හිතන්න දැන් හොදින් අනේ
ඇයත් වැරදි අම්මෙක්ද?

<u>බිඳුණු හදවත්</u>

බිඳුණු පසුවට සියුම් හදවත්
හදන්නට බෑ කෙදිනවත්
බිඳුණු වීදුරු මෙන්ම හදවත්
වටින්නෑ දැන් කාටවත්

බිඳුණු හදවත් මැසිය හැකිනම්
වැඩිම ගනනක් අලෙවි වන්නේ
ඇසට නොපෙනෙන ඉදිකට්ට සහ
එයට එක්වෙන නූලමයි

<u>ආත්මීය සහකරු</u>

නොපවසනලද වචනයක් වුව
වටහ ගන්නට හැකි වුණා
හිතින් මෙන් නොව මනස මගිනුත්
උතුම් සහකරු වන් වුණා

ජීවිතේ හැම වෙලාවක් තුල
මගේ ළගමයි දැවටුනේ
මිතුදමක් ලෙස ලියා තබනෙමි
එයද ප්‍රේමය ලෙසින් නම් වුණේ

ඉතින්,ආත්මීය සහකරුවන් වෙන්න ප්‍රේමයෙන්ම පමණක් වෙලිය යුතුමද?

<u>මනස</u>

අඳුරු පාරක වීදි අතරේ
කරක් ගහනවා රාත්‍රියේ
වීදි බලලුන් වීදි මිනිසුන්
නිදනවා මේ යාමයේ

ජීවිතේ ඇති අඳුරු භාවය
පෙනෙනවා දැන් ඇස් වලින්
කයක් නොමැතිව මනස පමණක්
සැරිසරනවා වීදියේ

<u>මැරුණු සිතිවිලි</u>

දුටුව රුවකට බැදුනු හදවත

ගලවගන්නට බැරි වුණා

තවම අද දින හදවතක් තුල

මැරි මැරිම එය උපන්නා

කිසි දිනෙකවත් හිමි නොවන බව

දැන දැනත් ඒ රුවම හෙව්වා

ජීවිතෙන් අත්තෙටම වැටිලා

තාම මැරි මැරි ඉපදෙනා

මැරුණු සිතිවිලි වලට පණදී

නැවත නැවතත් රුවම දුටුවා

හිමි නොවන බව හදට දීලා

එයත් හදෙහින් පිටවුණා

<u>නොමැකෙන රුව</u>

අඳුර සමගින් මුමුනමින් අද
කඳුළු නෙතු අග තද කරන්
ලොවට රහසේ හඬා වැලපෙමි
එක් රුවක් හිත තුල තියන්

<u>නොලැබුණු ප්‍රේමය</u>

ඉතින් දුර හිද බලන් හිටියා
නොලැබෙනා බව දැන දැනත්
හිතින් විතරක් පෙමුත් කෙරුවා
නැවත ප්‍රේමය නොලැබුණත්
ගතින් හැරයන බවත් දැන දැන
ඉතින් අදටත් පෙම් කරමි මම

## සුදු නෙලුම් මල

ගියේ අම්මාගෙ බල කිරීමට
උතුම් දළදා මාලිගාවට
කට්ට අව්වේ හිටන් හිටියා
සුදු නෙලුම් මල් අත දරාගෙන

මමත් ගත්තා මල් මිටක් ඒ
උතුම් දළදාවට තියන්නට,
සයවසක් ගත උවත් අද දින
දැක්කෙ නැහැ ඒ සුදු නෙලුම් මල

<u>නොමැකෙන පෙම් කව</u>

අකුරු ඇදවී බොදව ගොස් ඇති
යමක් ලැබුණා රාත්‍රියේ
පෑනෙ තින්තත් ඉහිරිලා ඇති
ලේ බිඳුත් තැන තැන ඇතේ

අසූ ගානට ගැහෙනවා මගෙ
හදවතත් මේ යාමයේ
කිසිදාක නොමැකෙන පෙම් කවක් ඇත
වෙව්ලනා මගෙ අත් මතේ

<u>සොල්දාදුවා</u>

වැසි වෙනුවට මහ පොළොවට
වැටුණු දේනම් රුධිරයයි
වසර තිහකදි නැතිවූ ජීවිත
නැවත නොඑනා බව දනියි

අපව අත හැර එදින ගිය අය
ගනින්නට බැරි බව දනියි
එදා සෙබලුන් දුන්නු ජීවිත
නිසා අප සැම නිදහසේ ජීවිත ගෙවයි.

## <u>අදුරු කුටිය 2</u>

අදුරු කුටියක යදම් බැද ඇති
හැගුම් ගොන්නක් සිර වෙලා
අදුරු කුටියක් වෙන්න පෙරදිම
සොදුරු කුටියක් විය එදා
යදම් බැද ඇති හැගුම් ගොන්නක
යදම් බිද හැකි නම් මෙදා
අදිරු කුටියක් නැවත පෙර ලෙස
සොදුරු කුටියක් වෙයි සදා

<u>බිදුණු වීදුරු</u>

ගැහැනු ළමයෙක් බිදුණු පසුවට
බිදුණු වීදුරු මෙන් වෙනා
නැවත සැකසිය නොහැකි ලෙසටම
සැවොම වීදුරු විසි කළා
බිදුණු වීදුරු නැවත අරගෙන
නැවත සැකසිය හැකි වුණා
නියම පිරිමින් බිදුනු වීදුරු
සොදුරු වීදුරු මෙන් කළා

<u>ඉරෙහි අයිතිය</u>

සඳේ තනියට තරු සිටියමුත්

ඉරත් තනියම දහවලේ

සඳෙහි අයිතිය තරුවකට දී

අදත් ඉර ඇත තනිකමේ

සඳෙහි අයිතිය ඉරෙහි නමටම

ලියාගන්නට බැරි වුණේ

සඳේ සතුටට ඉරේ තනිකම

සදා නොමැකෙන ලෙස ඇතේ

<u>අහිමි ප්‍රේමය</u>

රිදුනු තැන් වල නොරිදුනා ලෙස
කෝපයයි ඉන් පිට වුණේ
කිච්ච වචනය ගන්න නොහැකිව
විදවනා තුන් යාමයේ
හැඟීමක් නැති ලෙසින් වූවත්
ඔබට පමනයි ළං වුණේ
දෙන්න නොහැකිව සොදුරු ආලය
හැගුම් හද තුල සිර කලේ

යන්න පෙරදිම හදෙහි වූ දෙය
පවස ගන්නට හැකිවුණේ
පියෙකු වෙසෙසින් මගේ ආලය
මගේ දුව හට නැති වුණේ
අප්පච්චී යන සොදුරු නාමය
තාම මා හට  නොලැබුණේ
ලබන බවයක හැමෝටම පෙර
මගේ වෙන්නයි පතන්නෙ

<u>ශිෂ්‍යනායකයෙකුගේ නික්ම යාම</u>

නිසල සිරුරට අන්දවා ඇති
නිළ ඇඳුම අද පිළිවෙළයි
පපුවෙ වම් පස පළඳවා ඇති
පදක්කම දැන් දිස්නෙ දෙයි
ශිෂ්‍යනායක පවුලෙ සැම දෙන
හැඬූ කඳුලින් ශෝකවෙයි
ගුරුවරුන් පමණක්ම නොව දැන්
ලොවේ සැවොමත් ශෝක වෙයි

<u>හදවත නම් ගැලරිය</u>

මතක ගොන්නක් සිරවෙලා තිබු
හදවතක් නම් ගැලරියේ
මකා දැමුමට නොහැකි වූ දේ
බොහොමයක් ඇත හද තුලේ
මකා ගැනුමට අවැසි වූවත්
නොහැකි වන්නේ ඇයි ළදේ
කිසිදාක නොමැකෙන ලෙසින් අද
ඇත මතක ගොන්නක් මුල් ඇදී

<u>වෙන් වුණ ප්‍රේමය</u>

සඳ දෙසම ඉර බලා සිටියත්

ළගට යන්නට බැහැ අනේ

සොබා දහමත් එක්තරා ලෙස

ප්‍රේමයක්මයි වෙන් කළේ

සඳට පෙම්  කල ඉරෙහි වගතුග

සඳ සොයා බැලුවේ නැතත්

ඉරෙහි රශ්මිය ලබා ගෙනමයි

බැබලුනේ සඳ හැම රැයෙත්

## <u>වාසනාව</u>

විදුලි පහනින් එළිය වී නැති
මැටි ගැසූ බිත්තිය පෙනේ
වැස්ස දවසට වහළ මැදිනුත්
වතුර බින්දුත් ඉද හිට වැටේ
පරණ දූවිලි වලින් වැහිලා
පොත් මේසෙ ඇත පාළු වී
ඉගෙන ගන්නට ආස වූවත්
වාසනාවක් මට නැතී

<u>ආදරේ හොයන ඉර</u>

වැඩ දාහක් ගන්න මිනිස්සුත්

කවි ලිව්වෙම රෑ අහසට

ඉරෙහි සැර වැඩි නිසා හිත යන්නෙම

අර අහංකාර හදට

හද බැබලෙන්නෙ ඉරෙහි එළිය අරන්

බව දන්නවා උනාට

කවුරුත් නොදන්නවා ඇති ඇතැම් විට

ඉරත් ආදරේ හොයන බව

<u>කඩා වැටුණු තාරකාව</u>

නිසල අහසත් සසල වූයේ
කඩා වැටුනෙන් තාර කාවක්
ඈත දුර හිද මමත් පැතුවේ
ලැබෙන්නට ඔබ කෙදින හෝ
කඩා වැටෙනා තාරකාවෙන්
ඔබව ඉල්ලන්නට තරම්
එදා මෙන් මතු අදත් මම නම්
තනිකරම දැන් තනිවෙලා

## පියෙකුගේ ශෝකය

වියැලිලා ගිය දෑස් අතරේ
කඳුළු පිරිලා නැති නමුත්
වසන් වීලා ඉකිගසා හැඩූ
රැයක් විය දැන් ඔහු හටත්
නිසල සිරුරක් දෙස බලාගෙන
කෙලින් ඉන්නට බැරි වුණත්
ඇගේ ශක්තිය වෙලා ඔහු අද
හැඩුම් හද තුල හිර කරන්

මව හඩන වාරයක් පාසා
අප්පච්චී හිත සැනසුවත්
එකම කෙල්ලත් යන්න ගොස් ඇත
නොකියාම සැමගෙන් වෙන් වෙමින්
කිරි ගැහෙනා පපුව අල්ලන්
මිනී පෙට්ටිය වැසූ නමුත්
දුවගෙ සිරුරම කරට ගන්නට
සසරෙ කර ඇත පාපයක්

## <u>පරණ මතක</u>

පිපුණ රොබරෝසියා ගස් යට
පරණ මතකය දැන් නැතේ
වීදි අතරින් ඇවිදිනා විට
මතක හද තුල අළුත් වේ
කඳුළු උනනා නෙත් දෙකක් වුව
හැගුම් මරලා තිබෙන්නේ
නැවත මා වෙත පැමිණියත් ඔබ
හැගුම් කල් ගතවී තිබේ

<u>පතොක් මල්</u>

උදේ පිපිලා හවස පරවෙන
මලුත් අද නම් උඩගුවෙන්
කාලෙකට එක් වරක් පිපෙනා
සොඳුරු මල් නෙක වර්ණයෙන්
පාට පාටින් පිපෙන මල් වල
සොඳුරු බාවය දිස් වුණත්
ඉඩෝරය උව දරා ගන්නා
පතොක් ගස් ඇත තනි කමෙන්

ඉතින් ඉවසපන් පතොක්,

උඹේ ගස් වල මල් පිපෙන විට
කොයි මලුත් ඇත නිහඬ මෙන්

<u>ක්ෂිතිජය</u>

රටා මවනා අහස් ගැඹරේ
වලාකුළු ඇත පාවෙමින්
රටා මවමින් සිත් සතුටු කොට
එයත් පාවී යයි ඉතින්
රැල්ල ගහනා මුහුදු වෙරළේ
රගයි නිසි දෙස නිදහසේ
පාද සටහන් මකා දැමුමට
රැල්ල ඉක්මන් වෙයි අනේ

ඈත ක්ෂිතිජය එක් නොවන බව
සැවොම පවසයි මේ යමේ
පෙනෙන වුන් හට අහස් ගැබ සහ
මුහුදු ගැඹරත් යා කෙරේ
පිටින් පමණක් බැදුණු ක්ෂිතිජය
ලෙසයි ප්‍රේමය නම් වුණේ
ප්‍රේමයක් නොව මිතු දමක් ලෙස
එයත් ඒ ලෙස නිම වුණේ

## වෙන්වීම්

සිනහවෙන් පිරි මුහුණ අතරේ
යම් දුකක් සැගවී ඇතත්
පිටට නොපෙනෙන ලෙසින් සගවා
හදවතක් තුල සිර කරන්
වසර ගණනක් ගෙවුණ දිනයක්
නොපැතූ ලෙසකට හමු වුණත්
ඔබේ රුවනම් මගේ හද තුල
කිසි දාක නොමැකෙන මිරිගුවක්

අතින් අල්ලන් ගියපු පාරක
මතකයන් නොමැකී ඇතත්
මැවුණු වායාරූප හද තුල
ගොඩගසා තිබූ කාලයක්
ආදරෙන් පමණක්ම අපහට
බැදී ඉන්නට බැරි වුණත්
සදාකාලික ලෙසින් ඔබ මම
වෙන්ව ගිය ඒ එක් දිනක්

<u>මතක මාවත</u>

මතක මං තුල ඇවිද යන විට

හිතේ තනියට ඔබත් නෑ අද

රිදෙන පපුවට සැනසුමක් නැත

ගැහෙන හැටිවත් මමත් නොදැනම

නැවතිලායන එකම මොහොතක

මතක් වෙන්නෙම එක් රුවක් ලෙස

## <u>අයිතිය</u>

ඇහෙන ගීයක වචන දැනගෙන
තනුව පමණක් මුමුණමින්
රැඳුන හැමතැන මතක වායා
රූප පමණක් ඉතිරිවී
දකින හැමවිට හිත පුරාවට
දැනුනෙ එකමෙක තනිකමයි
හිතේ හැටියට රැඳුන තැන්වල
අයිතියක් නැත දැනටමත්.

# <u>ආල සිතුවිලි</u>

පාළු කැලයක අඳුර අතරේ
පිපී සැනහෙන එක් මලක්
කිසිම දිනයක කාටවත් නැත
කිසිදු ඉම්හිරි භාවයක්
කැලේ පිපිලා කැලේ පරවෙන
මලක අයිතිය කෙදිනවත්
නොලැබෙනාබව හොඳින් දැනගෙන
හිතට වාරණ දැමූවත්
හදෙහි පොරකන ආල සිතිවිලි
මැරිය නොහැකිය කෙදිනවත්

## වැහි බින්දුව

වැටෙන වැහි බිදු පොළොව මතටම
වැටෙන විටකදි නොරිදුනත්
වලාකුළ කින් වෙන්ව වැටෙනා
එකම මොහොතක නොරිදුනත්
බලා හිදිනා අපට පමණක්
රිදෙන්නේ ඇයි මෙලෙසටත්

## <u>බිඳුණු පොරොන්දුව</u>

අතින් අත ගෙන ගියපු මාවත්

හිස්වෙලා ඇත වත්මනේ

ළගම රැදෙනා පොරොන්දුව පිට

මමත් හිටියා මාවතේ

වසර ගණනක් ගෙවී ඇති විට

තවත් දැනෙන්නා තනිකමේ

මමත් දැන් ඇත ඔබත් මෙහි නැත

මමත් නෑ අද රාත්‍රියේ

# <u>ආල කිරීමේ කලාව</u>

දරාගන්නට බැරි තැනදී උව
දරාගෙන සිටි කාලයක්
හිතෙන් අයදින ප්‍රේම ගීයක
තනුව ඇමිණූ ගීතයක්
හිතේ ඇවිලුණු ගින්දරෙන් හද
දැවී අළු වුණු වෙලාවක්
හෘදයක් තුල පාරණාදෑ
පිටට පැමිණූ සැදෑවක්
ඔබේ මතකය හිතර එන විට
ගැහෙන හදවත වතාවක්
ප්‍රේමයක් හද තුල තියාගෙන
ආල කිරීමත් කලාවක්

## සඳේ අයිතිය 2

අඳුරු අහසක හඳේ තනියට

තරුත් සිටිනා රාත්‍රියක්

ඉරේ තබියට කිසිවෙකුත් නැති

පාළු එකමෙක සැදෑවක්

ඉරේ තනියට සඳේ අයිතිය

තරුවකට දුන් යාමයක්

පිටට නොපෙනෙන හදවතක් තුල

මියගියා එක් හැඟීමක්

## මාවතක සිදු වුණු ඝාතනය

නිසොල්මන් එක් හදවතක් මත

අතක් රැදිලා මාවතේ

රුධිරයත් හැම තැනම ගලලා

ලේ විලක් විය රාත්‍රයේ

ආලයත් එක් වෛරයක් ලෙස

පෙරලුනා ඒ යාමයේ

ආලයක් උව වෛරයක් ලෙස

වෙස් බැදිය හැක ලෝකයේ

<u>අහිංසක ඇස්</u>

අහිංසක ඇස් කතා නෑ අද
කඳුලු පිරිලා තිබෙන්නේ
පුංචි දේටත් රිදව ගන්නා
හිත් ගොඩක් ඇත ලෝකයේ
ඉක්මනින් හිත රිදව ගන්නා
අයෙක් වේ නම් ජීවිතේ
එයයි අපහට වෙනත් කාටත්
වඩා ආලය කරන්නේ

## පරවුණ්ද් මල

පිපී පරවුන ඩේසි මලකට

ආල කරනා හදවතක්

වේලිලා ඇති ඩේසිමල් හැම

අත දරාගෙන හිමි කරන්

අවැසි විට ඇත තමා ළගමත්

වේලිලා ඇති එක් මලක්

# <u>නොන්වතීම</u>

මුහුදු රැල්ලත් ඇවිත් යනවා
නැවතුමක් නැත එහි වුණත්
ජීවිතේ හැම කාලයක් තුල
නේක විද අය පැමිණුනත්
හදට දැනෙනා එක්කෙනෙක් උන
රැදෙන්නෑ දැන් කෙදිනවත්

හදවතක රිද්මයේ නිමාව



## පසුවදන

අධ්‍යාපන අමාත්‍යාංශය අනුමැතියෙන් දශකයකට වැඩි කාලයක් පාසල් දරුවන් දහස් ගණනක් ගත් කතුවරුන් දැයට දායාද කළ මෙම ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය පාසල් අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනයට බෙහෙවින්ම වැඩසටහනක් ඌ බව අධ්‍යාපනඥයන් ගේ පිළිගැනීම නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ වලට සමගාමීව මෙවර පාසල් දරුවන් පර්යේෂණ කෘතියක් රචනා කර ඔන්නට යොමුවීම ව්‍යාපෘති ගමන් මගේ හැරවුම් ලක්ෂයකි ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් ඇල්ෆා පරම්පරාව ට අනාගත ලෝකය පෙන්වා දෙන නූතන පාසල නූතන තාක්ෂණ මෙවලම් මෙන්ම පොතපත ද සමව පරිහරණය කළ යුතු බව පර්යේෂණාත්මකව පෙන්වා දෙන්නේ පොතකින් දරුවකු ලබන ආස්වාදය අන් කිසිවකුගෙන් වත් ලබා ලබාදිය නොහැකි නිසාය තවමත් අප අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලම් මෙන්ම මානව දැනුම ගබඩාවී ඇති පොත පතින් ලක්ව ගන්නට මෙන්ම අධ්‍යාපනය ගුණාත්මක සංවර්ධනය වෙනුවෙන් වසර ගණනාවක සිට මෙම ව්‍යාපෘතියට උරදී සිටින මහනුවර මහමායාබාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් හේමාලා උපහාර ග්‍රන්ථ කරන ව්‍යාපෘතිය දියත් වෙයි. පාසල් දරුවන් තුළ ශාස්ත්‍රීය හික්මීම මෙන්ම සාරධර්ම නිපුණතා ප්‍රවර්ධනයෙන් යුගයේ අවශ්‍යතාවයක් වන කාන්තාව සයිබල ගැන්වීමට ඉතිහාසයේ යුග මෙහෙවරක් ඉටු කළ හෙම්මාලා දැක්වීමද මෙහි මූලික අරමුණයි මහනුවර මහාමායාබාලිකා විද්‍යාලයේ දියණියන් විදුහල්පති පුතුමිය ගුරුබවතුන් දෙමව්පියන් ආදි ශිෂ්‍යාවන් සහ සෙසු පාසල් නියෝජනය කරන සියලු දෙනාටද දියවඩන නිලමේ තුමන් ඇතුළු ශ්‍රී දළදා මාලිගාවේ කාර්යමණ්ඩලයට ද මෙම කාර්ය වෙනුවෙන් ස්තුතිවන්ත වෙමු.

සෙනවිරත්න මහ ලේකම් (ව්‍යාපෘති නිර්මාතෘ)